# අනිත් කොන

## සායනික සටහන් නොවේ



**වෛද්‍ය බෝධිනී සමරතුංග**

**වෛද්‍ය බෝධිනී සමරතුංග ගේ ලිපි සන්නස පාඨකයනට ආගන්තුක නොවේ. කිවිඳියක බ්ලොග් රචිකාවියක වන බෝධිනී මේ වසරේ නෙළුම්යාය බ්ලොග් සම්මාන උළෙලේදී සම්මානයට ද පාත්‍ර වූවා ය. ශ්‍රී ලංකාවේ පුවත්පත් කීපයකම ඇගේ කොලම් පළවෙයි. නැවත වතාවක් සන්නස පාඨකයන් සමග ඇගේ අත්දැකීම් බෙදාගන්නට වෛද්‍ය බෝධිනී සමරතුංග මෙසේ අප හා එක්වෙයි.**



ඇඳක් ඇඳක් ගානේ වෙද නළාවත් එල්ලගෙන යනකොට ඒ ඇඳන් පාමුල පුටුවකට බර වෙලා ඔළුව ගහගෙන ඇඳ විට්ටමේ, බුදුවෙන්න පාරමී දම් පුරන බෝසත් අම්මලා, නිදි මරාගෙන දරුවන් කරේ එල්ලගෙන,

"තවම හොඳ නෑ ඩොක්ටර්"
"ඇයි දන්නෙ නෑ උණ එන්නේ,"

ඒවගේ කතා කියන්නේ බොහොම කණගාටුවෙන්. ඉතින් එකවරක් නොව සිය වරක් උනත් එන එන දොස්තරගෙන් නර්ස් නෝනෙක්ගෙන් එකම දේ අහන්නේ හිත සැහැල්ලු කරගන්න වෙන්නත් ඇති. වාට්ටුව වටේ ඇසෙෂන් ඇඳට යද්දී, මගේ කරේ නළාවේ පැටලිලා එකතුවෙන දුක් කඳුළු සෝ සුසුම් , හිතට ගෙන එන්නේ බරක්

ඩෙංගු රෝගීන් ගණනෙහි අඩුවක් දකින්න තිබුනත්, නේවාසිකව තවමත් ඩෙංගු ඇන්ටිජන් පොසිටිව් ඒවගේම නෙගටිව් වුනත් ප්ලේට්ලට් අඩුවෙන පිරිසක් තවම එනවා , ප්‍රතිකාර ගන්නවා.

කලින් තිබුනු අමුතුම ආකාරයේ රෝගීන් උතුරා යෑමක් දැන්නම් පෙනෙන්නට නෑ. ඔය අතරේ, මම රෑ වැඩ සඳහා වාට්ටුවට පැමිනෙද්දිම මිස් කෙනෙක් කීවේ..
"ඩොක්ටර් අන්න අර අහවල් ඇඳේ බබා පැය තුනක්ටම මූත්‍රා මිලි ලීටර් 25 දාලා තියෙන්නේ" කියලයි...

ඔන්න ඉතින් ෆයිල් එක අරන් පසුගිය සටහන් බලද්දී තේරුණ දෙයක් තමයි, මේ දරුවා ඊට කලින් සෑම පැය තුනකටම වරක් සීයකට වඩා මූත්‍රා දමා තිබෙන බව. මේවගේ එකපාරම අඩුවීම් තමා භයානක. කෝකටත් පෙර උගත් පාඩම් ඇති නිසා එක පාරක් පැය තුනක්ම ගියේ මිලි මීටර් නමයයි කීව අම්මෙක් නිසා අපේ හදවත් නවතින්න ගිහින් මොකුත් කරන්න කලින් "කෝ මනින කප් එක" කියලා ඒක බලද්දී, මිලි ලීටර් 9 කියා අවුන්ස 9ක් පෙන්නුවා කප් එක පිරෙන්න එතකොට වූ ගිහින්.

ඔන්න ඔහොම වැඩ කරන අම්මලා ඉන්න නිසා, අපිට එයාලා මූත්‍රා මනින කප් එක ඉල්ලගෙන හොයාගෙන බලන්නත් වෙනවා. ඔව් අර මූත්‍රා මනින කප් එක, සිරින්ජ් එක.... එක සැරයක් කිලෝ 40 කියලා ගහපු සිරින්ජරයක් නිසා 40 ඒවා 7 දැම්මා කීව බබෙක් ගැන, ඒකත් කලබල වෙන්න කලින් ඔය සිරින්ජරෙ පෙන්වන්න කීව නිසා යන්තම් කරදර වෙන්න කලින් සිද්ධිය බේරුම් කර ගත්තා.

හැබැයි ඊයේ අම්මා නම් එක හෙලා කියා හිටියා. හරියට මැන්න බව.
මායි මිසුයි යනවා ඇඳ ළගට... "කෝ දෙන්න කෝප්පේ"
අම්මා කෝප්පේ දෙනවා...
මට පේනවා අවසාන අගය ලෙස අඩියට පොඩ්ඩක් උඩින් සටහන් වෙන්නේ 100 පක ඒ කියන්නේ මිලි ලීටර් 100 ඊට පස්සෙ 150 , 200 ඔහොම වැඩි වෙමින් යන්නේ ඉහළට යනකම්... දැන් මට පුදුම අම්මා කොහොමද 25 පක මැන්නේ කියලා.

"කෝ අම්මේ මිලි ලීටර් 25 සලකුණ"

අම්මා අන්දුන් කුන්දුන්... "අනේ මට ඇස් පේන්නෙ නෑ, පුතා තමයි කීවේ 25 කියලා"

# මූත්‍රා මැනීමේ මහා වැඩමුළුව

ඔන්න බළලා මල්ලෙන් එළියට පනිනවා. දරුවා නිදි.. මේ අවුරුදු 12 විතර වෙන ඔය

**මේ ලංකා අහස යට ආණ්ඩුවේ ඉස්පිරිතාලෙක වැඩකරනවා යනු විටෙක අප, නඩුකාර උන්නාන්සෙලාය, විටෙක ගණිත ගුරුවරුන් ය. විටෙක පෝෂණවේදීන් ය. විටෙක පවුල් ආරවුල් විසඳන අයවලුන් ය. ඇඳුම් සපයන්නෝය, සෙල්ලම් බඩු සපයන්නෝ ය. මදුරු දැල් ගෙන එන්න ආධාර සොයන්නවුන් ය. මිතුරන් සමග එකතුවී වාට්ටු ජේන්ටි කරන ජේන්ටි බාස්සුනැහැලාය.**

අපිව නුරුස්සන සෙට් එකේ පොඩ්ඩෙක්.

මම කතා කරලා අහනවා, "පුතේ කොහොමද ඔයා විසිපහක් කීවේ..."
"අනේ මං දන්නෑ.. මට හිතිච්ච ගානක් කිවා" ඔන්න දරුවාගේ උත්තරේ
එහෙම කියලා චක් චුක් ගාලා මෙන්න මේ පැංචා ආයෙම බුදි.

දැන් අම්මා ඔරවගෙන ඉන්නවා අපි දිහා.
"අම්මේ මොකද කරන්නේ , මේ දරුවට ඩෙංගු ( ඇන්ටිජන් පොසිටිව්) එතකොට මේ දරුවාගේ මූත්‍රා මනින එකයි දියර හරියට දෙන එකයි තමයි ඔයා කරන්න ඕනෙ"

"කෝ බලමු මනින ඒවා ලියන කොළ"
ඒකත් බලද්දී හොඳටම ලියලා තිබ්බට මට තේරුනා මේ අම්මට එහෙම විශේෂ වැටහීමක් මේ කරන වැඩේ ගැන නැති බව.
"ඇයි මේ වැඩිපුර දීලා" මම අහද්දී උත්තරේ වුනේ
"බොනකොට වමනෙ ගියා එනිසා මම ආයෙත් වැඩිපුර ප්‍රමාණයක් දුන්නා" කියලයි.

"වමනේ ගියොත් අපිට කියන්න ඕනෙ, එහෙම ඔයාට ඕනෙ විදිහට පොවන්න බෑ" මම පැහැදිලි කළා.

"ඇයි මේ උණ බහින්නේ නැත්තේ"
මම මේ මූත්‍රා ප්‍රශ්නෙ විසඳන්න හදද්දී අම්මා වෙන වෙන ඒවා අහනවා මග අරින්න ප්‍රශ්නෙන්.

"දැන් අම්මේ ඔයාට කලින් හිටපු ඩොක්ටත් ලොකු මැඩමුත් මේවා පැහැදිලි කළා, ඔන්න ඩොක්ටර් අර ඩොක්ටර් මාලිත් මෙයාට පැයක් විතර අඩගහලා පැහැදිලි කළා" මිස් මට කියනවා.

"අම්මේ මේ කරන දේ හරියට කරන්න කියන්නේ අපි හොයන බලන නිසා නෙමේ. ඔයාගේ දරුවා කරදරයක් නැතිව ලෙඩ හොඳ වුනොත් ඒක ඔයාගේ සැනසීම. මේ දේවල් කරන්නේ අපිව සනසන්න නෙමේ"

අපි කළේ මිලි ලීටර් 10 සිරින්ජරේ ගානේ මේ අම්මට දෙන එක, අල්ලපු ඇඳේ ඉන්න ආච්චියෙක් , එයාවත් චෙක් කරා නිකමට , අනේ එයාගෙ කෝප්පෙත් 100 ml වලට වඩා අඩුවෙන් මනින්න බෑ. ඒ පාර එයාටත් ඔන්න කියලා දුන්නා.

ඊළගට ආයෙම ඒ පොත බලද්දී, එක පාරම බොන්න දුන්නු ගාන වෙනස් කරලා. මම එහෙම කරෙත් නැති නිසා බලද්දී, ළමයගෙ අම්මා, ආච්චිට බබා බලන්න බාර දෙද්දී වරද්දලා කියලා කියලයි තේරුනේ.

"අනේ පුතේ මට 40 ml තැන පේන්නෙ නෑ" කියමින් මං ළගට ආයෙම ආවා කෝප්පේ උස්සගෙන, ඒපාර වෝඩ් රවුන්ඩ් එක පැත්තක තියලා, ටිපෙක්ස් එකක් ගෙන්නගෙන මෙයාලට සලකුණු කරලා දුන්නා "අපිම ආයේ මේ ප්‍රමාණ වෙනස් කරනකම් මෙහෙම තමා" කියලා.

ඊළගට මම දහයට ඇවිත් බලනවා. කෝ අර බබාගේ පැයෙන් පැය මැන්නද කියලා
"අම්මේ පහුගිය පැයේ කීයක් දැම්මද?"
"සිරින්ජරෙන් තුනක්"
ආ ඒකියන්නේ 30 පක මම ගණන් හදා ගන්නවා.

"ඊළග පැයේ?"
"දැම්මේ නෑ, මැන්නෙ නෑ, කෝ මට කීවේ නෑනේ"

37 වන පිටට